0116

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

# ඉස්ලාම් ශිෂ්ටාචාරය I
# இஸ்லாமிய நாகரிகம் I
# Islamic Civilization I

47 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරන්න (පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න**.

---

1. අල්-කුර්ආනයෙහි වාක්‍ය මක්කි හා මදනි වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වයි. මක්කි හා මදනි වාක්‍යවල ප්‍රධාන ලක්ෂණ පහත දැක්වේ.
   A - හොඳ ගුණාංග හා සමාජ නිර්මාණය
   B - වචනවල හා පදවල සංක්ෂිප්ත බව
   C - මරණයෙන් පසු ජීවිතය පිළිබඳ විශ්වාසය හා නබිවරුන්ගේ ඉතිහාසය
   D - ඒකදේවවාදය පිළිගැනීම හා බහුදේවවාදය ප්‍රතික්ෂේප කිරීම
   E - සහෝදරත්වය හා සමාජ ආරක්ෂාව
   F - දීර්ඝ සූරාස් හා දීර්ඝ වාක්‍ය
   ඉහත සඳහන් ඒවා අතුරෙන් මක්කි වගන්තිවල ප්‍රධාන ලක්ෂණ
   (1) A, C හා E ය. (2) A, D හා F ය. (3) B, C හා D ය. (4) B, D හා E ය. (5) C, E හා F ය.

2. සිද්දි ලෙබ්බේ විසින් රචිත ග්‍රන්ථ **තුනක්** ඇතුළත් කාණ්ඩය
   (1) ආසන්බේගේ චරිතය, ෆත්හුද් දයියාන්, අස්රාරේ කුදි
   (2) ෆත්හුද් දයියාන්, අස්රුල් ආලම්, තොලුකයි අඩවු
   (3) අසන්බේගේ චරිතය, සුරුතුස් සලාත්, තුහ්ෆතුන්නහ්වි
   (4) හිදායතුල් කාසිමීයා, බිදයාතුල් හිදායා, ෆත්හුද් දයියාන්
   (5) අස්රාරේ කුදි, තුහ්ෆතුන්නහ්වි, ආස්රාරුල් ආලම්

3. ශ්‍රී ලංකාවේ වරාය නගරවල මුස්ලිම්වරුන්ගේ බලපෑමෙන් වරාය නායකයින් බිහි කළේ ය. මෙලෙස කොළඹ වරායේ ආධිපත්‍යය ගත් තැනැත්තා වනුයේ
   (1) නාකුදා ඉබ්‍රාහිම් ය. (2) ජලස්ති ය. (3) කෝයාජාන් ය.
   (4) වස්කුහිම් ය. (5) අබූ උස්මාන් ය.

4. ශතවර්ෂ පහක් තිස්සේ පැවති අබ්බාසීය කිලාෆතය ටාටර්වරුන් විසින් විනාශ කරනු ලැබී ය. නමුත් ඔවුන්ගේ අඛණ්ඩ ජයග්‍රහණය අවසාන කරනු ලැබුවේ අයුන් ජාලුද් යුද්ධයෙනි. එහිදී මුස්ලිම්වරුන්ගේ ජයග්‍රහණය සඳහා වගකියූ පාලකයකු වූයේ කවුද?
   (1) සුල්තාන් සෙයිෆුදීන් සදූස් (2) සුල්තාන් සලාහුදීන් අයියුබි
   (3) සුල්තාන් මලික් ෂා (4) සුල්තාන් නූරුදීන් අර්සලාන්
   (5) සුල්තාන් මුහම්මද් ෂා

5. පහත සඳහන් ඒවායින් නිවැරදි වගන්තිය කුමක් ද?
   (1) තෆ්හිමුල් කුර්ආන්හි කතුවරයා සයිද් කුත්බ් ය.
   (2) ඉෂ්නා අෂරිය්යා යනු ෂියාවරුන් අතර එක් කණ්ඩායමකි.
   (3) අස්මාඋර් රිජාල්, හදීස් හි 'මත්න්' පිළිබඳ අධ්‍යයනයට ඇතුළත් වේ.
   (4) දිම්මිවරුන්ගෙන් ඛරාජ් බද්ද අය කරන ලදී.
   (5) ජසීරතුල් යාකුද් අරාබි අර්ධද්වීපයට කියනු ලබන නමකි.

6. 19 වෙනි ශතවර්ෂයේ අග භාගයේ දී මාපිල්ලෙයි ලෙබ්බේ ආලිම් හා සිද්දි ලෙබ්බේ යනු වැදගත් මුස්ලිම් පුද්ගලයන් වේ. ඔවුන් දෙදෙනා විසින් වැලිගම හා කොළඹ පිහිටුවනු ලැබූ අධ්‍යාපන ආයතන **දෙක** වන්නේ
   (1) මක්කියියා අරාබි විද්‍යාලය හා අල් හිදායා විද්‍යාලයයි.
   (2) බහ්ජතුල් ඉබ්‍රාහිමිය්යා අරාබි විද්‍යාලය හා අල් ඉක්බාල් විද්‍යාලයයි.
   (3) මද්රසතුල් බාරි අරාබි විද්‍යාලය හා මද්රසතුල් කයිරියියා ය.
   (4) අෂ්රෆිය්යා අරාබි විද්‍යාලය හා අල් මින්නතුල් ෆාසියියා විද්‍යාලයයි.
   (5) අල් මිසානියියා අරාබි විද්‍යාලය හා සහිරා විද්‍යාලයයි.

[ දෙවෙනි පිටුව බලන්න.

agaram.lk

7. වෛද්‍ය විද්‍යාවට මුස්ලිම්වරුන්ගෙන් ඉටුවූ මෙහෙය ලෝක ශිෂ්ටාචාරයට කළ ඉමහත් දායකත්වයකි. පහත සඳහන් වගුවේ X හි වෛද්‍යවරුන්ගේ නම් හා Y හි ඔවුන්ගේ වෛද්‍ය ග්‍රන්ථවල නම් දක්වේ.

| X | | Y | |
|---|---|---|---|
| (i) | අලිබින් සීනා | A | අල්-හාවි |
| (ii) | අස්-සහ්රාවි | B | කානුන් ෆිත්තිබ්බි |
| (iii) | අර්-රාසි | C | අත් - තස්රිෆ් |
| (iv) | ඉබ්නු සහ්ල් | D | සාදුල් මුසාෆිර් |
| (v) | ඉබ්නු ජස්සාර් | E | ෆිර්දව්ස් උල් හික්මා |

කතුවරුන්ට අනුව ඉහත සඳහන් ග්‍රන්ථ නිවැරදි ව අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.
(1) A, B, C, D, E
(2) A, C, D, E, B
(3) B, A, C, E, D
(4) B, C, A, E, D
(5) C, B, E, D, A

8. පාර්ලිමේන්තුවේ කථානායක ලෙස කටයුතු කළ මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීන් ඇතුළත් කාණ්ඩය
(1) එච්. එස්. ස්මයිල්, බාකීර් මාකර්, එම්. එච්. එම්. අෂ්රෆ්
(2) බාකීර් මාකර්, බදියුද්දීන් මහමුද්, ඒ. සී. එස්. හමීඩ්
(3) එච්. එස්. ස්මයිල්, බාකීර් මාකර්, එම්. එච්. මොහොමඩ්
(4) බාකීර් මාකර්, එම්. එච්. මොහොමඩ්, රවුෆ් හකීම්
(5) එම්. එච්. මොහොමඩ්, එම්. එච්. එම්. අස්වර්, හලීම් ඉෂාක්

9. ඉස්ලාමීය නීතිය පිළිබඳව 'ෆදවා ආලම් ගීරි' නමැති ග්‍රන්ථය සම්පාදනය කළ මෝගල් පාලකයා
(1) ජහන්ගීර් ය.
(2) ෂාජහාන් ය.
(3) අව්රන්ගසීබ් ය.
(4) බහදූර් ෂා ය.
(5) අක්බර් ය.

10. අවිසෙන්නා (Avicenna) හා රහ්සීස් (Rhazez) යන නම්වලින් ප්‍රසිද්ධ වූ මුස්ලිම් විද්වතුන් **දෙදෙනා**
(1) සකරිය්යා අර්රාසි හා අල්-ෆාරාබි ය.
(2) අලි බින් සීනා හා ඉබ්නුල් හයිසම් ය.
(3) ඉබ්නු රුෂ්ඩ් හා ක්වාරිස්මි ය.
(4) අලි බින් සීනා හා සකරිය්යා අර්රාසි ය.
(5) කුත්බුදීන් අෂ්ෂිරාසි හා ඉබ්නු රුෂ්ඩ් ය.

- පහත දක්වෙන්නේ මුස්ලිම් අධිරාජ්‍යවල නම් හා ප්‍රධාන නගරවල නම් වේ. මෙය අධ්‍යයනය කර අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A | මක්කා | H | ස්පාඤ්ඤය |
| B | මදීනා | I | ඉන්දියාව |
| C | ඩමස්කස් | J | මධ්‍යම ආසියාව |
| D | බැග්ඩෑඩ් | K | ඉරානය |
| E | ඉස්තාන්බුල් | L | මොරොක්කෝව |
| F | බස්රා | M | ලිබියාව |
| G | මලබාර් | N | ඊජිප්තුව |

11. වලිද් බින් අබ්දුල් මලික් කලීෆාගේ කාලය තුළ අත්පත් කර ගනු ලැබූ ප්‍රදේශ ඇතුළත් කාණ්ඩය
(1) B, C, N ය. (2) H, I, J ය. (3) K, M, N ය. (4) F, L, G ය. (5) D, L, M ය.

12. කාදිරිය්යා හා ෂාදුලිය්යා තරීකා ඇති වූ ප්‍රදේශ ඇතුළත් කාණ්ඩය
(1) I, F ය. (2) J, M ය. (3) G, N ය. (4) B, G ය. (5) D, L ය.

13. සුල්තාන් මුහම්මුද් අල්-ෆාතිහ් විසින් අත්පත් කර ගනු ලැබූ නගරය
(1) G ය. (2) H ය. (3) E ය. (4) F ය. (5) C ය.

14. ජාමිඋල් අස්හර්, ජමියතුල් කරවිය්යුන් හා මුස්තන්සිරිය්යා යන කලායතන පිහිටි ස්ථාන
(1) N, L, D ය. (2) D, H, M ය. (3) A, B, C ය. (4) D, K, L ය. (5) B, F, K ය.

15. උමයියා, අබ්බාසීය හා උස්මානීය කිලාෆත්වල අගනගර වූ ස්ථාන
(1) B, D, G ය. (2) D, E, K ය. (3) A, F, K ය. (4) C, D, E ය. (5) B, C, D ය.

16. කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පතිවරුන් ලෙස කටයුතු කළ අධ්‍යාපනඥයින් **දෙදෙනා** වනුයේ
(1) ආචාර්ය ටී. බී. ජයා හා ඒ. එම්. ඒ. අසීස් ය.
(2) සිද්දි ලෙබ්බෙ හා අයි. එල්. එම්. ඒ. අසීස් ය.
(3) අයි. එල්. එම්. ඒ. අසීස් හා ඔරාබි පාෂා ය.
(4) ආචාර්ය ටී. බී. ජයා හා ආචාර්ය බදියුද්දීන් මහමුද් ය.
(5) ආචාර්ය බදියුද්දීන් මහමුද් හා අයි. එල්. එම්. ඒ. අසීස් ය.

[ තුන්වෙනි පිටුව බලන්න.

agaram.lk

0116



17. පහත සඳහන් වගන්තිවලින් **වැරදි** වගන්තිය තෝරන්න.
(1) බහුතරයට අනුව කලීෆා ලෙස අබූබකර් (රලි) තෝරා ගනු ලැබී ය.
(2) කියාස් නමැති අරාබි වචනයේ අර්ථය වන්නේ මිනුම, සැසඳීම හා සමාන කිරීම යන්නයි.
(3) සහාබාවරුන්ගේ තෆ්සීර්, තෆ්සීර් බිල් මඃකුල් ලෙස හැඳින්වේ.
(4) සුප්‍රසිද්ධ විද්වතකු වූ අල් බෙරූනි ඔහුගේ 'කිතාබ් උත් තෆ්හිම්' ග්‍රන්ථයෙහි ලෝකයේ වටකුරු සිතියමක් ඇඳ තිබේ.
(5) 'යම් ක්‍රියාවක් ඉටුකිරීමට මිනිසාට සම්පූර්ණ නිදහස ඇත. ඕනෑම ක්‍රියාවක් නිර්මාණය කරන්නේ ඔහුම ය. ඔහුගේ ක්‍රියාවට වගකිව යුත්තේ ද ඔහුම ය.' යනු මුඃතසිලාවරුන්ගේ දර්ශනය වේ.

18. ඉස්ලාම් ශිෂ්ටාචාරය වහී මගින් ඉදිරිපත් කරන ලද තව්හිද්, රිසාලත්, මආද් යන මූලධර්ම මත පදනම් වේ. එහි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ
(1) බහුතරය මුස්ලිම් ජනයා ඇති පරිසරයක් සඳහා සුදුසු වීම ය.
(2) ලෞකික පැත්ත නොසලකා, ආධ්‍යාත්මික පැත්තට වැදගත් තැනක් දීම ය.
(3) ලෞකික, ආධ්‍යාත්මික පැති දෙක එකතු වී තිබීම හා විශ්වයට ගැළපීම ය.
(4) මිනිසා කැමති හා අකමැති දේ සඳහා යෝග්‍ය වීම ය.
(5) මනුෂ්‍ය බුද්ධියට වැදගත්කමක් දෙන අතර විවිධ ප්‍රදේශවල ගැළපෙන විවිධ ප්‍රවේශයන් තිබීම ය.

19. මුස්ලිම්වරුන් විසින් කොන්ස්තන්තිනෝපලය අත්පත් කරගත් වර්ෂය
(1) 1326 ය. (2) 1344 ය. (3) 1453 ය. (4) 1458 ය. (5) 1517 ය.

20. අල්-කුර්ආනයෙහි සත්‍ය බව තහවුරු කිරීම සඳහා මූලික හේතුවක් ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) සහබාවරුන්ගෙන් බහුතරය විසින් අල්-කුර්ආනය කටපාඩම් කරගනු ලැබීම
(2) එය හෙළිදරව් වූ විගසම, එය ලිවීමෙන් හා මතකයේ තබා ගැනීමෙන් ආරක්ෂා කිරීම
(3) කාලීෆා අබූබකර් හා උස්මාන් විසින් ඔවුන්ගේ කාලය තුළ දී, එය ග්‍රන්ථයක් ලෙස සකස් කිරීම
(4) අවශ්‍යතාව පැන නැගුණු විට, නබිතුමා විසින් අල්-කුර්ආන් වැකි පැහැදිලි කිරීම් කරනු ලැබීම
(5) ප්‍රධාන යුතුකම වූ නැමදුමෙහි දී අල්-කුර්ආනය කියවීම

21. කොළඹින් පළවා හරින ලද මුස්ලිම්වරුන්ට රැකවරණය දුන් මහනුවර සිංහල රජතුමා කවුද?
(1) විමලධර්මසූරිය
(2) සෙනරත්
(3) දෙවන රාජසිංහ
(4) ශ්‍රී වික්‍රම රාජසිංහ
(5) කීර්ති ශ්‍රී රාජසිංහ

22. 'ජසිරතුල් යාකුත්' ලෙස හැඳින්වෙන රට
(1) අරාබි අර්ධද්වීපය ය.
(2) ශ්‍රී ලංකාව ය.
(3) මාලදිවයින් ය.
(4) මැඩගස්කරය ය.
(5) ඉන්දියාව ය.

agaram.lk

23. ජාත්‍යන්තර ජ්‍යොතිෂ්‍ය සංගමය විසින් සඳෙහි කොටසකට මුස්ලිම් පාලකයකුගේ නම දී ඇත. එම මුස්ලිම් පාලකයාගේ නම
(1) හාරූන් අර් රෂීඩ් ය.
(2) සලාහුද්දීන් අයූබි ය.
(3) III වන අබ්දුර් රහ්මාන් ය.
(4) මඃමූන් ය.
(5) II වන හකම් ය.

24. හිජ්රා මත පදනම් වූ ඉස්ලාමීය කැලැන්ඩරය හඳුන්වා දුන් කලීෆා කවුද?
(1) උමර් බින් කත්තාබ් (රලි)
(2) උමර් බින් අබ්දුල් අසීස් (රහ්)
(3) වලීද් බින් අබ්දුල් මලික්
(4) මඃමූන්
(5) මුආවියා (රලි)

25. තේරුම පැහැදිලි කර නොමැති විවිධ අදහස් කීමට යොමු කළ හැකි අල්-කුර්ආන් වගන්තිය හඳුන්වනු ලබන නම
(1) මුහ්කම් ය. (2) මුත්ලක් ය. (3) මුතසාබිහ් ය. (4) මුජ්මල් ය. (5) මුකය්යද් ය.

26. දිම්මිවරුන් ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?
(1) මුස්ලිම් නොවන්නන් ය.
(2) අහ්ලුල් කිතාබ් ලෙස හඳුන්වනු ලබන යුදෙව්වන් හා කිතුනුවන් ය.
(3) මුස්ලිම් නොවන රටවල වෙසෙන මුස්ලිම්වරුන් ය.
(4) මුස්ලිම් රාජ්‍යයට බදු ගෙවන ජනයා ය.
(5) මුස්ලිම් රාජ්‍යයේ ආරක්ෂාව යටතේ ජීවත් වන මුස්ලිම් නො වන්නන් ය.

27. මුස්ලිම්වරුන්ට වැදගත් වන මස්ජිද **තුනක්** පිහිටි ස්ථාන වන්නේ
(1) පලස්තීනය, බැග්ඩෑඩ් හා බස්රා ය.
(2) මක්කම, මදීනා හා කුෆා ය.
(3) මදීනා, කුෆා හා කයිරෝ ය.
(4) මක්කම, මදීනා හා පලස්තීනය ය.
(5) මදීනා, ඩමස්කස් හා බස්රා ය.

[ හතරවෙනි පිටුව බලන්න.

28. විවිධ ක්ෂේත්‍රවලට මුස්ලිම්වරුන්ගෙන් ඉටු වූ දායකත්වය සඳහන් කෙරෙන ග්‍රන්ථ කිහිපයක් සහ ඒවායේ කතුවරුන්ගේ නම් ලැයිස්තුවක් අක්‍රමවත් පිළිවෙළට පහත දක්වේ.

(i) අජායිබුල් හින්ද් — A අල්-බලාධුරි
(ii) සුරතුල් අර්ල් — B ඉබ්නු ෂහ්රියාර්
(iii) කිතාබුල් මනාසීර් — C ඉමාම් සාෆිඊ
(iv) ෆුතූහුල් බුල්දාන් — D අල්-ක්වාරිස්මි
(v) අර් රිසාලා — E ඉබ්නුල් හයිසම්

මෙහි දක්වා ඇති පොත්වල අනුපිළිවෙළට කතෘවරුන්ගේ නම් ගැළපෙන වරණය කුමක් ද?

(1) A, B, C, D, E
(2) B, A, C, E, D
(3) B, D, E, A, C
(4) C, A, B, E, D
(5) E, D, C, B, A

29. ශ්‍රී ලංකාවේ මුස්ලිම් පුද්ගල නීතියේ 'බතාවියානු ආටිකල්' ලෙස හැඳින්වෙන නීති සංග්‍රහය හඳුන්වා දෙනු ලැබුවේ

(1) බ්‍රිතාන්‍යයන් විසිනි.
(2) දකුණු ඉන්දියානු මුස්ලිම්වරුන් විසිනි.
(3) ලන්දේසීන් විසිනි.
(4) සිංහල රජවරුන් විසිනි.
(5) පෘතුගීසීන් විසිනි.

30. ඉස්ලාමීය ලෝකයේ සුපතල තරීකා හා ඒවායේ ආරම්භක ස්ථාන පෙන්වන ලැයිස්තුවක් පහත දක්වේ.

(i) නක්ෂබන්දියියා — A සිරියාව
(ii) ජිස්තියා — B බස්රා
(iii) රිෆායියා — C බුකාරා
(iv) සාදුලිය්යා — D මොරොක්කෝව

තරීකා හා ඒවායේ ආරම්භක ස්ථාන නිවැරදි අනුපිළිවෙළට ගැළපූ විට දක්විය හැක්කේ

(1) A, B, C, D ලෙස ය.
(2) B, C, A, D ලෙස ය.
(3) C, A, B, D ලෙස ය.
(4) C, B, D, A ලෙස ය.
(5) D, A, C, B ලෙස ය.

• අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නවල යෙදුම් දෙක බැගින් දී ඇත. මෙම යෙදුම්වලට අදාළ ප්‍රතිචාර පහත (1), (2), (3), (4), (5) යනුවෙන් දක්වා ඇත. ඒ අනුව එක් එක් ප්‍රශ්නයෙහි යෙදුම්වලට වඩාත් ගැළපෙන සම්බන්ධතාව දක්වෙන නිවැරදි පිළිතුරෙහි **අංකය** තෝරන්න.

| අංකය | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| (1) | නිවැරදි ය. | වැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමු යෙදුම තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| 31. | මිහ්රාබ් කිබ්ලාවේ දිසාව පෙන්නුම් කරයි. | හුජ්ජතුල්ලා අල් බාලිහා, අල්ලාමා සිර්හින්දි විසින් රචිත ග්‍රන්ථයකි. |
| 32. | පළමුවන අබ්දුල් රහ්මාන් විසින් මුස්ලිම් ස්පාඤ්ඤයේ නිදහස් උමයියාද් පාලනය පිහිටුවන ලදී. | මුතවාතිර් හදීස්, සහීහ් හදීස් සහ හුසෙන් හදීස් ලෙස කණ්ඩායම් දෙකකට වර්ග කළ හැකි ය. |
| 33. | කලීෆා හාරූන්ගේ පාලන සමයේ දී බොහෝ සේ බලවත් වූ බර්මකීවරුන් කලීෆා මෑමූන් විසින් මරා දමන කරන ලදී. | මිනිසාගේ යුතුකම් අතර ලෝකයේ දිව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම අයත් වන්නේ ඉමාරත්ට ය. |
| 34. | අල් මාවර්දි විසින් ලියන ලද දේශපාලන විද්‍යාව පිළිබඳ ග්‍රන්ථය අහ්කාමුල් කුර්-ආන් ලෙස හැඳින්වේ. | ආචාර්ය ටී. බී. ජයා, කෝල්බෲක් තුමා විසින් හඳුන්වා දුන් ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිතයකු විය. |
| 35. | හර්දයේ වම් පැත්තේ සිට දකුණු පැත්තට පෙණහලු හරහා රුධිරය ගලන බව දක්වෙන සිද්ධාන්තය ඉබ්නු නෆීස් ඉදිරිපත් කළේ ය. | ලෝකය ගෝලාකාර බව දක්වෙන අදහස ඉදිරිපත් කළ අය අතර ක්වාරිස්මි ද වේ. |



agaram.lk

36. හුදයිබියා ගිවිසුම අත්සන් කළ කුරයිෂ් නියෝජිතයා වූයේ
(1) අම්ර් ඉබ්නු ලුහයි ය.
(2) සුහයිල් බින් අම්ර් ය.
(3) අබ්දුල්ලා බින් රවාහා ය.
(4) මිර්සාස් බින් කයිස් ය.
(5) සුහයිර් බින් අබී උමයියා ය.

37. ඉස්ලාමීය දේශපාලන ක්‍රමයේ මජ්ලිසුස් සූරා හා සම්බන්ධ අණ පනත්වලට අදළ වගන්ති කිහිපයක් පහත දක්වේ. ඒවායින් එකක් වැරදි ය. එම **වැරදි** වගන්තිය තෝරන්න.
(1) මජ්ලිසුස් සූරා හි සාමාජිකයින් තෝරා ගැනීමේ අයිතිය කලීෆාට දෙනු ලැබී ය.
(2) මුස්ලිම්වරුන් මජ්ලිසුස් සූරා හි තීරණ පිළිපැදීමට බැඳී සිටින්නේ ෂරීඅත් නීති රීතිවලට පටහැනි නොවන විට ය.
(3) මජ්ලිසුස් සූරා හි තීරණ ක්‍රියාත්මක කිරීම කලීෆාගේ වගකීම විය.
(4) මජ්ලිසුස් සූරා හි සාමාජිකත්වයේ කාලසීමාව තීරණය කරනු ලැබූයේ කලීෆාගේ කැමැත්ත හා අකමැත්ත අනුව ය.
(5) මජ්ලිසුස් සූරා හි සාමාජිකයන්ට ඔවුන්ගේ අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමේ අයිතිය දෙනු ලැබී ය.

38. හිජ්රි 4 වෙනි හා 5 වෙනි ශතවර්ෂවල දී අධ්‍යාපන ආයතන ගණනාවක් පිහිටුවන ලදී. අමාත්‍ය නිලාමුල් මුල්ක් විසින් පිහිටුවන ලද අධ්‍යාපන ආයතනය වන්නේ
(1) නිසාමිය්යා ය. (2) මුස්තන්සිරිය්යා ය.
(3) තාජිය්යා ය. (4) සලාහිය්යා ය.
(5) බෂිරිය්යා ය.

39. ඉස්ලාමීය ආගමික කලාවන්හි අරාබි වචන බොහොමයක් යෙදේ. පහත සඳහන් ඒවායින් හදීස්වලට සම්බන්ධ **නොවන** වචනය කුමක් ද?
(1) මක්බූල් (2) මර්දූද් (3) මර්ෆූ
(4) මව්කූෆ් (5) මම්ලූක්

40. ෂිආවරුන්ගේ ප්‍රධාන විශ්වාස දක්වෙන කාණ්ඩය
(1) ඉබාදත්, ඉමාරත්, කිලාෆත්, විලායත් (2) ඉමාමිය්යාත්, ඉස්මත්, කිලාෆත්, මඃරිෆත්
(3) ෂරීඅත්, තාරික්ත්, හකීකත්, විලායත් (4) ඉමාමිය්යාත්, ඉස්මත්, තකිය්යා, රජ්ඉය්යා
(5) උලූහියියා, රුබූබියියා, කිලාෆත්, ඉබාදත්

41. 'ජාමිඋල් කුරාන්' නමින් හැඳින්වෙන සහාබිවරයා
(1) අබූබකර් (රළි) ය. (2) උස්මාන් (රළි) ය.
(3) සයිද් බින් සාබිත් (රළි) ය. (4) මිආස් බින් ජබෙල් (රළි) ය.
(5) මුආවියා (රළි) ය.

42. තිත් හා රවුම් නොමැතිව සිරස් රේඛා හා කෝණ සහිත අරාබි ලේඛන කලාව වන්නේ
(1) රයිහානි ය. (2) සුලුසි ය. (3) කූෆි ය.
(4) රිකා ය. (5) හත් පාපූරි ය.

43. පලස්තීනයේ ගාසා හි උපත ලැබූ ඉස්ලාමීය නීති විද්වතකු වන්නේ
(1) ඉමාම් අබූ හනීෆා ය. (2) ඉමාම් නවවි ය.
(3) ඉමාම් සාෆිඊ ය. (4) ඉමාම් යූසුෆ් ය.
(5) ඉමාම් අහ්මද් බින් හන්බල් ය.

44. ඉස්ලාමයේ ජයග්‍රහණය තහවුරු කිරීමෙහිලා කාදිසිය්යා සහ යෙර්මුක් යුද්ධ වැදගත් විය. මෙම යුද්ධ පැවැති ප්‍රදේශ වන්නේ
(1) පර්සියාව හා රෝමයයි.
(2) ආමේනියා හා අසර්බයිජානයයි.
(3) මධ්‍යම ආසියාව හා උතුරු අප්‍රිකාවයි.
(4) සුළු ආසියාව හා මධ්‍යම ආසියාවයි.
(5) සින්ද් හා ස්පාඤ්ඤයයි.

45. ඉඃවානල් මුස්ලිමූන්, ජමාඅත් තබ්ලිඃ, ජමාඅතේ ඉස්ලාමි යන සමකාලීන ඉස්ලාමීය දඃවා ව්‍යාපාරයේ පුරෝගාමීන් වන්නේ
(1) ඉමාම් හසන් අල් බන්නා, මව්ලානා ඉල්යාස් හා මව්ලානා මෞදූදි ය.
(2) සෙයිද් කුත්බ්, සකරිය්යා සහීබ් හා නර්ම් සිද්දික් ය.
(3) උමර් තිල්මිසානි, ඉනාමුල් හසන් හා යූසුෆ් ඉස්ලාහි ය.
(4) හසන් හුදයිබි, සකරිය්යා සහීබ් හා මව්ලානා මව්දූදි ය.
(5) සෙයිද් කුත්බ්, ඉමාමුල් හසන් හා යූසුප් ඉස්ලාහ් ය.

agaram.lk

[ හයවෙනි පිටුව බලන්න.

- ජාහිලිය්යා සමයේ සිටි ප්‍රධාන ගෝත්‍රිකයින්ගේ නම් පහත දක්වේ. ඒවා කෙරෙහි අවධානය යොමු කරමින් අංක **46** සිට **50** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | බනූහාසිම් | E | බනූකයිනුකා | I | කිනානා |
| B | අව්ස් | F | බනූ නජ්ජාර් | J | හුසාආ |
| C | බනූබකර් | G | බනූ උමයියා | K | බනූ තමීම් |
| D | කයිස් | H | හස්රජ් | L | බනූකුරෙයිලා |

46. අකබා දෙවන ගිවිසුමෙහි එකඟතාවයකට පැමිණීමේ දී සහභාගී වූ මදීනාවෙන් පැමිණි ගෝත්‍ර
(1) B සහ J ය.
(2) H සහ C ය.
(3) B හා H ය.
(4) D සහ I ය.
(5) E සහ L ය.

47. හුදයිබියා ගිවිසුමේ කොන්දේසිවලට අනුව පාර්ශ්ව දෙකට ම අනෙකුත් ගෝත්‍ර සමග සුහද ගිවිසුම් ඇති කරගැනීමට අනුමැතිය තිබේ. නබිතුමා හා කුරයිෂ්වරුන් අතර සුහද ගිවිසුමට අත්සන් කළ කණ්ඩායම් **දෙක**
(1) B හා I ය.
(2) D හා C ය.
(3) F හා J ය.
(4) G හා K ය.
(5) J හා C ය.

48. ජාහිලිය්යා සමයේ දී හර්බුල් ෆුජ්ජාර්වලට සහභාගී වූ කණ්ඩායම් **දෙක**
(1) A හා G ය.
(2) A හා K ය.
(3) C හා F ය.
(4) D හා E ය.
(5) I හා D ය.

49. අහ්සාබ් යුධ සමයේ දී නබිතුමා සමග කළ ගිවිසුම කඩකිරීම සම්බන්ධව, සයිද් බින් මුආද් (රලි) විසින් දඬුවම් දෙනු ලැබූ කණ්ඩායම
(1) B ය.
(2) C ය.
(3) E ය.
(4) F ය.
(5) L ය.

50. නබිතුමා මදීනාවට පැමිණි විට ඔහු පදිංචි වූ ස්ථානය අයත් වූයේ
(1) A ට ය.
(2) C ට ය.
(3) D ට ය.
(4) F ට ය.
(5) J ට ය.

* * *

agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத்
Department of Examinations, Sri Lanka Department **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

**47 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
***Three hours***

උපදෙස්:

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. (i) මුස්ලිම්වරුන් අතර විවිධ සිද්ධාන්ත ඇති වීමට හේතු පරීක්ෂා කරන්න.
   (ii) මුඃතශිලා යනු කවරහු ද? ඔවුන්ගේ ආරම්භයේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරන්න.
   (iii) මුඃතශිලාවරුන්ගේ මූලික සිද්ධාන්ත විස්තර කරන්න.
   (iv) මුඃතශිලා හා අෂ්අරිය්යා අතර ඇති වෙනස්කම් සඳහන් කරන්න.
   (v) මුස්ලිම්වරුන් අතර විවිධ සිද්ධාන්ත දරන්නන් බිහි වීමෙන් මුස්ලිම් සමාජයට ඇති වූ බලපෑම් පැහැදිලි කරන්න.

2. (i) ඉජ්තිහාද් යනු කුමක් ද? ඉජ්තිහාදය ස්ථාපිත කිරීමට තුඩු දෙන කුර් ආන් හා සුන්නා හි ඇති සාධක පැහැදිලි කරන්න.
   (ii) නීති මූලාශ්‍රයක් ලෙස සලකන ඉජ්මාඋ සඳහා වූ කොන්දේසි සඳහන් කරන්න.
   (iii) 'ඉජ්තිහාද් හි දෙර වැසී ඇත, යන මතය ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයේ ඇති කළ බලපෑම පැහැදිලි කරන්න.
   (iv) වර්තමාන ගැටලු විසඳීමේ දී ඉජ්තිහාද් හි කාර්යභාරය සාකච්ඡා කරන්න.
   (v) නීති විශාරදයකු ලෙස ඉමාම් සාෆීගේ දායකත්වය සාකච්ඡා කරන්න.

3. (i) ලංකාවට ඉස්ලාමය හඳුන්වාදීම පිළිබඳ ව පැහැදිලි කරන්න.
   (ii) වෙරළබඩ ප්‍රදේශවල මුස්ලිම්වරුන්ගේ මුල් පදිංචිවීම්වලට හේතු පරීක්ෂා කරන්න.
   (iii) ලන්දේසි යුගයේ දී ආගමික හා ආර්ථික ක්ෂේත්‍රවල මුස්ලිම්වරුන් මුහුණ දුන් තර්ජන සාකච්ඡා කරන්න.
   (iv) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන අභිවෘද්ධියේ දී මාපිල්ලෙයි ලෙබ්බේ ආලිම්ගේ හා සිද්දි ලෙබ්බේගේ කාර්ය සංසන්දනය කරන්න.
   (v) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන අභිවෘද්ධිය සඳහා ටී. බී. ජයා මැතිතුමාගෙන් ඉටු වූ මෙහෙය පැහැදිලි කරන්න.

agaram.lk

## II කොටස

4. (i) "නබිතුමාගේ මදීනා හිජ්රතය සැලසුම් කළ ක්‍රියාවක් විය." පැහැදිලි කරන්න.
   (ii) ඉස්ලාමය ව්‍යාප්තියේ දී හිජ්රත් හි බලපෑම සාකච්ඡා කරන්න.

5. (i) වෛද්‍ය විද්‍යාව කෙරෙහි මුස්ලිම්වරුන් උනන්දු වීමට මඟ පෑදූ හේතු පැහැදිලි කරන්න.
   (ii) වෛද්‍ය ක්ෂේත්‍රයේ අලි ඉබ්නු සීනා හා ඉබ්නු නෆීස්ගේ දායකත්වය සාකච්ඡා කරන්න.

6. (i) උමයියා කිලාෆතය කිලාෆතුර් රාෂිද වෙතින් වෙනස් වන ආකාරය සාකච්ඡා කරන්න.
   (ii) උමයියාද් හා අබ්බාසීය කිලාෆත් අතර තිබූ සමානකම් හා වෙනස්කම් හඳුන්වන්න.

7. (i) තෆ්සීර් යනු කුමක් ද? තෆ්සීර් හි ආරම්භයට මඟ පෑදූ හේතු සඳහන් කරන්න.
   (ii) තාබිඊන් සමයේ දී තෆ්සීර් හි සිදු වූ සංවර්ධනය විස්තර කරන්න.

8. (i) තස්කියා යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? මනුෂ්‍ය ජීවිතයෙහි තස්කියා හි වැදගත්කම පැහැදිලි කරන්න.
   (ii) ඉස්ලාම් ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණ විස්තර කරන්න.

* * *